# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1791/16 - 2013 ජනවාරි මස 01 වැනි අඟහරුවාදා - 2013.01.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකුවේ නිවේදන

**විනිමය පාලන පනත යටතේ දැන්වීම**

**(ලංකා ව්‍යවස්ථාදායක ප්‍රඥප්ති සංග්‍රහයේ 423 වැනි අධිකාරය)**

1. විනිමය පාලන පනතේ 3 හා 48 වන වගන්ති සමග කියවෙන එකී පනතේ 5, 6, 6A සහ 7 යන වගන්තිවලට යටත්ව ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයින් විසින් ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන පුද්ගලයින්ට සපයන ලද භාණ්ඩ හා සේවා වලට අදාළ ගෙවීම් විදේශ ව්‍යවහාර මුදලින් භාරගැනීමට මෙමගින් අවසර ප්‍රදානය කරන අතර එකී විදේශ ව්‍යවහාර මුදල් භාර ගත් පුද්ගලයා විසින් දින 7ක් ඇතුළත පහත ආකාරයකින් සිය සන්තකයෙන් බැහැර කළ යුතු වේ.

    (අ) එවැනි ව්‍යවහාර මුදල් භාර ගත් පුද්ගලයා විසින් බලපත්‍රලාභී වාණිජ බැංකුවක ඔහුගේ නමින් විවෘත කර පවත්වාගෙන යන විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුමේ (FEEA) තැන්පත් කිරීම ; හෝ

    (ආ) බලපත්‍රලාභී වාණිජ බැංකුවකට විකිණීම.

2. ශ්‍රී ලංකාවේ තොටුපලවලින් ශ්‍රී ලංකාවට ඇතුල් වන හා ශ්‍රී ලංකාවෙන් පිට වන මගීන්ට තීරු බදු සහන යටතේ භාණ්ඩ හා සේවා සැපයීමට අවසරලත් ව්‍යාපාරයක් පවත්වාගෙන යන ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයෙකුට ද, භාණ්ඩ හා සේවා ලබාගත් මගියාගේ නේවාසික තත්ත්වය සැලකීමෙන් තොරව, මෙම ගැසට් පත්‍රයේ ඇතුළත් විධිවිධාන අදාළ වේ.

පී. එච්. ඕ. චන්ද්‍රවංශ,
විනිමය පාලක.

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ දී ය.

01-470

1A - G 017080 — 355 (2013/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.